පැවරුම :- සතිය - 10 (2021- 03 - 08 සිට 2021- 03 - 14 දක්වා)

ඒකකය 02 :- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

ක්‍රියාකාරකම අංක 03 :- ඉංග්‍රීසීන් විසින් උඩරට බලය තහවුරු කර ගැනීම.

පැවරුම් අංක 03 :- උඩරට රාජධානිය තුළ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම.

හැඳින්වීම :- 1815 වන විට උඩරට ඇතිව තිබෙන මෙම ව්‍යාකූල තත්ත්වය සිය වාසියට හරවා ගත් බ්‍රිතාන්‍යයන් උඩරට ආක්‍රමණ කිරීමට තීරණය කර ඇත. එහිදී ජෝන් ඩොයිලිගේ බුද්ධි තොරතුරු ඉතා වැදගත් විය. එමෙන්ම මේ වන විට ඉංග්‍රීසීන් වෙත පලා ගොස් සිටි ඇහැළේපොළගේ උපදෙස් මත උඩරට ආක්‍රමණයට බ්‍රිතාන්‍යයන් සූදානම් විය.

සිසු උපදෙස් :-

*පියවර 01* පෙළ පොතෙහි පිටු අංක 32 - 34 දක්වා හොඳින් කියවා ගන්න.

*පියවර 02* ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කරගන්න.

*පියවර 03* පෙළපොත උපකාරී කරගෙන පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

***ක්‍රියාකාරකම 01***

1) 1815 උඩරට යටත් කර ගැනීමට උඩරට සේනාංක කීයක් පැමිණ තිබේද?

2) බ්‍රිතාන්‍ය හමුදා මහනුවරට ඇතුල්වීමත් සමඟ උඩරට රජු පලා ගොස් සැඟවුණු ප්‍රදේශය නම් කරන්න.

3) 1816 දී උඩරට රජු පිටුවහල් කළ ප්‍රදේශය කුමක්ද?

4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසව නම් කරන්න.

5) 1815 උඩරට ගිවිසුම අත්සන් කරන සමයේ බ්‍රිතාන්‍ය පාලකයා නම් කරන්න.

6) බ්‍රිතාන්‍ය රජු වෙනුවෙන් උඩරට ගිවිසුමට අත්සන් තැබූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුරුන්ද?

7) උඩරට ගිවිසුමට අත්සන් තැබූ උඩරට රදළ ප්‍රධානීන් තිදෙනෙකු නම් කරන්න.

8) උඩරට ගිවිසුම වගන්ති කීයකින් සමන්විත වීද?

9) උඩරට ගිවිසුම අත්සන් කළේ කවදාද හා කුමන ස්ථානයකදීද?

10) උඩරට ගිවිසුමේ 5 වන වගන්තියෙහි අන්තර්ගතය ලියා දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද

ර/ කලවාන ජාතික පාසල

නිවිතිගල අධ්‍යාපන කලාපය